# ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

**වාර්ෂික වාර්තාව 2022**

## ස්තුතිය..

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු සඳහා සහාය ලබාදීම සම්බන්ධයෙන් තාක්ෂණ අමාත්‍යාංශයට හා  අධ්‍යාපන අමාත්‍යාංශයට කළමනාකාරිත්වයේ කෘතඥතාවය හිමිවේ. කොමිෂන් සභාවේ සභාපතිවරයා හා සාමාජිකයන් විසින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු ඉටු කිරීමේදී කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් ලබාදුන් සහයෝගිතාවය හා උපකාරයන් අගය කොට සලකනු ලබයි.*

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව පිළිබඳව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජයට විද්‍යා හා තාක්ෂණ කරුණු සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති සම්පාදනය කරන හා උපදෙස් සපයන ප්‍රමුඛතම ආයතනය ලෙස නම් කරනු ලැබ ඇත. කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමන් විසින් පත් කරනු ලබන සාමාජිකයන් සත් දෙනෙකුගෙන් සමන්විත වේ.

### පරිශ්‍රයේ ලිපිනය

හයවන මහල, D කොටස,“සෙත්සිරිපාය”II වන අදියර, බත්තරමුල්ල

### ඇමතුම් තොරතුරු

011- 2186711

011- 2186713

info@nastec.gov.lk

www.nastec.gov.lk

ලංකා බැංකුව, හයිඩ් පාක්

විගණකාධිපති දෙපාර්තමේන්තුව

# පටුන


ස්තුතිය.. ...... 2

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව පිළිබඳව ...... 3

රූප ලැයිස්තුව ...... 5

වගු ලැයිස්තුව ...... 5

(1994 අංක 11 දරන) විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් නියම කරන ලද කර්තව්‍යයන් ...... 6

විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ පැතිකඩ ...... 8

ආයතනික ව්‍යුහය ...... 9

සභාපතිවරයාගේ සමාලෝචනය ...... 10

අධ්‍යක්ෂකගේ වාර්තාව ...... 12

කොමිෂන් සභා සාමාජිකයෝ ...... 14

භාණ්ඩාගාර නියෝජිතයෝ ...... 16

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය – 2022 ...... 17

කාර්ය සාධනය පිළිබඳ විශේෂ වැඩසටහන් - 2022 ...... 18

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (1): විද්‍යාව හා තාක්ෂණය දියුණුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීම ...... 18*

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (2): ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම ...... 19*

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (3): විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම ...... 19*

*ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (4): විද්‍යා හා තාක්ෂණ ආයතනයනට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ රජයට උපදෙස් ලබාදීමට ප්‍රථම අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතන විමසීම ...... 21*

ජාත්‍යන්තර කටයුතු ...... 27

*නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre) ...... 27*

මානව සම්පත් සංවර්ධනය ...... 30

කාර්ය මණ්ඩල පුවත් ...... 31

සුභසාධන කටයුතු ...... 31

ආයතනික පාලන වාර්තාව ...... 32

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව ...... 33

මූල්‍ය ප්‍රකාශන ...... 34

විගණකාධිපති වාර්තාව ...... 38

පසුගිය වසර 10 හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ ...... 45

# රූප ලැයිස්තුව


*රූපය 1 : පනත හා නීති, දැක්ම හා මෙහෙවර ........ 6*
*රූපය 2: ආයතනික ව්‍යුහය ........ 9*
*රූපය 3 : නස්ටෙක් සමාලෝචන වාර්තා ගරු අමාත්‍යතුමාට නිලවශයෙන් ප්‍රදානය කිරීම........ 20*
*රූපය 4 : ඇතිවිය හැකි ආහාර අර්බුදයකදී ලබාදිය හැකි ආහාර විසඳුම් සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය ........ 23*
*රූපය 5 : ඩෙංගු වෛරස් ආසාදනයනට අදාළ මානව ප්‍රතිශක්තිය 'සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වෙබ් සම්මන්ත්‍රණය........ 24*
*රූපය 6 : තිරසරබව කරා යොමුවූ නව සොයාගැනීම්/ නවෝත්පාදන සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වෙබ් සම්මන්ත්‍රණය........ 24*
*රූපය 7 : ජිනෝමය ගවේෂණය පිණිස ජානමය සළකුණුකරණයන් සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වැඩමුළුව........ 25*
*රූපය 8 : ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදානයන් ලබාගැනීම සඳහා වූ ක්‍රමෝපාය පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වැඩමුළුව ........ 25*
*රූපය 9 : තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ තේමාත්මක විද්‍යුත් ප්‍රකාශනය - පරිසර තිරසරබව සහ ආහාර සුරක්ෂිතතාව........ 26*
*රූපය 10 : නොබැඳි ජාතීන්ගේ සාමාජික රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15වන පාලක සභාවේ දෙවන කාර්යාංශ රැස්වීම........ 28*
*රූපය 11 : මහාචාර්ය වෛරන්ජ කරුණාරත්න ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් වැඩ භාරගැනීම......... 31*
*රූපය 12: මූල්‍ය ප්‍රකාශනය - පිටුව 1........ 35*
*රූපය 13: මූල්‍ය ප්‍රකාශනය - පිටුව 2........ 37*
*රූපය 14: පෙර වසර 10 (2013-2022) හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ ........ 45*


# වගු ලැයිස්තුව


*වගුව 01. පෙර වසර 10 (2013-2022) හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ ........44*

## (1994 අංක 11 දරන) විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් නියම කරන ලද කර්තව්‍යයන්

**පනත හා නීති**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා පනත මගින් ස්ථාපනය කරන ලද අතර, 1998 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වේ. 1998 දෙසැම්බර් මස 06 වන දින විධිමත් පරිදි අරඹන ලද එය 1999 ජනවාරි මාසයේදී සක්‍රීය කොමිෂන් සභාවක් බවට පත්විය.

**දැක්ම**

"ශ්‍රී ලාංකික ජනතාවගේ යහපත හා සමෘද්ධිය නංවාලනු පිණිස වූ විභවතාවන් සහිත හා ඒ සඳහා විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම සඳහා රජයට උපදෙස් ලබාදෙන අති විශිෂ්ට උපදේශනායතනයක් බවට පත්වීම."

**මෙහෙවර**

"තිරසර සංවර්ධනය උදෙසා විද්‍යා හා තාක්ෂණ අංශයන්ගේ ශක්‍යතාව වර්ධනය පිණිස රජය වෙත ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා සැලසුම් සම්පාදනය"

*රූපය 1 : පනත හා නීති, දැක්ම හා මෙහෙවර*

පහත සඳහන් ක්ෂේත්‍රයනට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම්ද ඇතුළත්ව විද්‍යා හා තාක්ෂණ සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබාදීම:

- ආර්ථික අභිවෘද්ධිය ඉහළ නැංවීම පිණිස විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම;
- කර්මාන්ත, කෘෂිකර්ම, සේවා හා ආර්ථික ක්ෂේත්‍රයනට අදාළ කාර්යක්ෂමතාවය හා තරගකාරිත්වය සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ අංශයේ බලපෑම;
- ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවනු පිණිස සෞඛ්‍ය, පෝෂණ හා දුගීබව දුරැලීම යන ක්ෂේත්‍රයන් මත විද්‍යාවේ හා තාක්ෂණයේ බලපෑම;
- අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ සඳහා වගකිව යුතුවන බලධාරීන් විමසමින් විද්‍යාව හා තාක්ෂණය සඳහා අවශ්‍ය මානව හා සෙසු සම්පත් සංවර්ධනය;
- ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් සංවර්ධනය හා කළමනාකරණය;
- ජාතික වැදගත්කමකින් යුතු විය හැකි විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම හා ප්‍රමුඛතාගතකරණය;
- විද්‍යා හා තාක්ෂණ ප්‍රවීණත්වය ගොඩනැගීම, පවත්වා ගැනීම හා ආකර්ශනය සඳහා තුඩු දෙන පරිසරයක් නිර්මාණය කිරීම;
- විද්‍යාව හා තාක්ෂණය ඵලදායක ලෙස යොදාගැනීම සඳහා තුඩුදෙන කළමනාකරණ ක්‍රමෝපායන් ස්ථාපනය;
- විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි පර්යේෂණ සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා ප්‍රමුඛත්වය ලබාදීම ඇතුළත්ව විද්‍යාව හා තාක්ෂණය සඳහා අරමුදල් වෙන් කිරීම.

පෙර වසරේ ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ක්‍රියාමාර්ගයන්හි ඵලදායකත්වය, විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි කාර්ය සාධනය, විද්‍යාව හා තාක්ෂණය සඳහා වූ රජයේ වියදම්හි ඵලදායකත්වය හා රාජ්‍ය අංශය විසින් විද්‍යාව හා තාක්ෂණය යොදා ගැනීම සම්බන්ධයෙන් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම;

විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ දෙවන කොටස තුළ දක්වා ඇති අරමුණු සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණික ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය;

විද්‍යා හා තාක්ෂණික ආයතනයන්ට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීමට ප්‍රථම එවන් අදාළ ආයතනයන්හි අදහස් විමසීම;

අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය සහිතව වසර දෙකකට වරක් ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සමුළුව කැඳවා පනතේ දෙවන කොටස තුළ දක්වා ඇති අරමුණු හා සම්බන්ධව ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ සංසදයක් ඇති කිරීම ; හා එම සාකච්ඡාවන් සම්බන්ධ වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම.

## විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ පැතිකඩ

- *සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධානියා වේ.*


- *අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධාරියා වේ.*

- *ආංශික ප්‍රතිපත්ති, ක්‍රමෝපාය සැලසුම් හා සෙසු විද්‍යා හා තාක්ෂණ ආශ්‍රිත ලේඛන සකසා ඉදිරිපත් කරනු වස් ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයෝ හා විද්‍යාඥයෝ බාහිර පාර්ශවකරුවන් හා උපදේශාත්මක සංසද සමග කටයුතු කරති.*

- *නියෝජ්‍ය අධ්‍යක්ෂ - මුදල් හා පරිපාලන විසින් මූල්‍ය හා පරිපාලන කටයුතු මෙහෙයවනු ලබයි.*

- *පනත මගින් බලය ලබාදී ඇති පරිදි විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ආයතනික සමාලෝචන කාර්යයන් සිදුකරනු පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් පෙළ ගස්වනු ලබයි.*

## ආයතනික ව්‍යුහය




රූපය 2: ආයතනික ව්‍යුහය

## සභාපතිවරයාගේ සමාලෝචනය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ (NASTEC) සභාපතිවරයා වශයෙන් 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේදී වැඩ ආරම්භ කරන ලද කාලයේ පටන් ආයතනයේ ක්‍රියාකාරකම් ඉටු කිරීමේදී කොමිෂන් සභාවේ සේවකයින්ගේ කැපී පෙනෙන දියුණුව පිළිබඳව ඔවුන්ට ප්‍රශංසා කිරීමට කැමැත්තෙමි. එහි ප්‍රතිපලයක් ලෙස මෙම වසර තුළ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද කාර්යයන් ඇතුළත් 2022 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකි වීම සතුටට කරුණකි.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව, විද්‍යා හා තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් රජයට උපදෙස් සපයන ප්‍රමුඛතම ආයතනය වන අතර විද්‍යා හා තාක්ෂණික ප්‍රතිපත්ති සම්පාදනය කරන සහ උපදේශකත්වය ලබා දෙන ආයතනය ලෙස කටයුතු කරයි. ඒ අනුව, 2022 දී, NASTEC විසින් ජාතික ජීනෝම ද්‍රව්‍ය මධ්‍යස්ථානය හා ජාතික ජීනෝම දත්ත සුරක්ෂිතගාරය ගොඩනැගීමේ ප්‍රතිපත්තිය සැකසීම සඳහා ක්‍රියාකාරීව සහභාගී විය. එමෙන්ම ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට දේශීය දැක්මක් අන්තර්ගත කිරීම වැනි රේඛීය අමාත්‍යාංශවල ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට ද පහසුකම් සලසන ලදී. සැලකිය යුතු ප්‍රතිපත්ති නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින්, ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව (BICOST) 2023 සඳහා පූර්ව සම්මන්ත්‍රණ ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීම, කෘෂිකර්මය, දේශගුණික විපර්යාස, බලශක්තිය, පෝෂක ඖෂධ සහ ඛනිජ අගය එකතු කිරීම ඇතුළු වැදගත් මාතෘකා කෙරෙහි අවධානය යොමු කර ඇත.

NASTEC විසින් කාර්ය සාධන ඇගයීම්, විද්‍යා හා තාක්ෂණ දත්ත රැස් කිරීම සහ උපදේශන සංසද ඇතුළුව විවිධ ප්‍රවේශයන් භාවිතා කරමින් තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීම සිදු කරන ලදී. ප්‍රධාන ක්‍රියාකාරකමක් ලෙස, ආයතනික සමාලෝචන 2022 ඔක්තෝම්බර් මාසයේදී නැවත ආරම්භ කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත වාර්තා ලැබුණි. මෙම සමාලෝචන ක්‍රියාවලියට සම්බන්ධ විශේෂඥ මණ්ඩල සහ ආයතන වෙත මාගේ කෘතඥතාව පළ කරමි. විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව සම්පාදනය කිරීමේ කොටසක් ලෙස, NASTEC විසින් තත්‍ය කාලීන දත්ත ග්‍රහණය කර ගැනීම සඳහා ඩිජිටල් වේදිකාවක් නිර්මාණය කරන ලද අතර එය කාර්යක්ෂමව දත්ත රැස් කිරීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.

තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ (YSF) 10 වැනි වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය ජාතික පර්යේෂණ සහ සංවර්ධන රාමුවේ (NRDF) අවධානය යොමු කළ ක්ෂේත්‍ර 10 ප්‍රවර්ධනය කළ අතර ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තියේ ප්‍රධාන ක්ෂේත්‍රවල පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම අවධාරණය කරන ලදී. මෙම ප්‍රයත්නයන් ශ්‍රී ලංකාව තුළ විද්‍යාව හා තාක්‍ෂණය දියුණු කිරීම සඳහා NASTEC හි කැපවීම අවධාරණය කරන අතර එය කැබිනට් අනුමැතිය ලත් ජාතික ප්‍රතිපත්ති රාමු සමඟ සමපාත වේ.

2022 වසරේ ජාත්‍යන්තර සහයෝගිතා ලෙස, ඉන්දියාවේ NAM S&T මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර වැඩමුළු සහ සහයෝගිතා සඳහා ශ්‍රී ලාංකික විද්‍යාඥයින් අට දෙනෙකුට සහභාගී වීමට NASTEC පහසුකම් සලසන ලදී. NASTEC ආයතනය සම්බන්ධීකරණය සඳහා වූ කේන්ද්‍රස්ථානය කර ගනිමින්, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් NAM S&T මධ්‍යස්ථානයේ 15 වන පාලක මණ්ඩලයේ 2 වන කාර්යාංශ රැස්වීමේ මුලසුන ද හෙබවිය. මීට අමතරව, NASTEC විසින් ජාත්‍යන්තර විද්‍යා කවුන්සිලය සමඟ සහයෝගයෙන් මාර්ගගත ජාත්‍යන්තර වැඩමුළු දෙකක් පවත්වන ලදී.

NASTEC විසින් දකුණු කොරියාවේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතන (STEPI) සමග ඒකාබද්ධ තාක්ෂණ හුවමාරු ව්‍යාපෘති ඉලක්ක කරමින් ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහයෝගිතාවයෙන් ඇති කරලීම පිළිබඳව සොයා බැලීමක් කරන ලදී. මෙමගින් හා තාක්ෂණික අංශයේ ධාරිතාව ඉහල නංවා මුලා වාසි ලබා ගැනීමේ පසුබිම් නිර්මාණය වනු ඇත.

මෙම කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් අප ආයතනයේ දියුණුව සහ ජයග්‍රහණයන් වෙනුවෙන් කැපවීමෙන් ක්‍රියාකරන කාර්ය මණ්ඩලයක් සිටින බව දැකීමම ගෞරවයකි.අප ආයතනයේ ක්‍රියාකාරකම් ඉටුකිරීම වෙනුවෙන් කැප වූ අප අමාත්‍යාංශයටත් කොමිෂන් සභා සාමාජිකයන්ටත් මම කෘතඥ වෙමි.අප එක්ව විශිෂ්ටත්වයේ නව පරිච්ඡේදයන් සනිටුහන් කරමින් දිගු කාලීන සමාජ බලපෑමක් ඇති කිරීමට කටයුතු කරන්නෙමු.

ඉදිරි වසරවලදීත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

**මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න**

සභාපති

අගෝස්තු 07, 2023

## අධ්‍යක්ෂකගේ වාර්තාව

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත යටතේ ලබාදී ඇති බලතල ප්‍රකාර විද්‍යාව හා තාක්ෂණය නංවාලීමට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රමෝපාය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙත අවශ්‍ය උපදෙස් ලබාදීමේ කාර්යය ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත පැවරී ඇත. තවද, විද්‍යා හා තාක්ෂණ සමාලෝචන වාර්තාවක් රජය වෙත ඉදිරිපත් කිරීමට කැපවී සිටින අතර, එය පෙර වසරේ ශ්‍රී ලංකාව තුළ සිදුකරන ලද විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ ඇගයීමක් මගින් ද සිදු වේ. මෙයට අමතරව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විවිධ විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය නිරීක්ෂණය කරමින් ද්වි වාර්ෂික පදනමින් ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ සමුළුව සංවිධානය කිරීමේ වගකීමද දරන ආයතනය වේ.

ජිනෝම මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික ජිනෝම දත්ත ගබඩාව පිහිටුවීම වැනි මූලාරම්භයන් සකස් කිරීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙමින්, 2022 වසර තුළ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව ජාතික ප්‍රතිපත්ති සංවර්ධන කාර්යයෙහි සක්‍රීය ලෙස නිරත විය. ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය තුළට දේශීය දෘෂ්ටි කෝණයන් ඒකාබද්ධ කිරීම විශේෂ කොටගෙන සිය ප්‍රතිපත්ති සම්පාදන කටයුතුවලදී අදාළ අමාත්‍යාංශයන්ට අවශ්‍ය සහාය ලබාදීමෙහි ලා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදී. 2023 IX වන ද්වි-වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව සඳහා සූදානම් වීමේදී සැලකිය යුතු ප්‍රතිපත්ති නිර්දේශ ලබාදීමට යටත්ව කෘෂිකර්මය, දේශගුණික විපර්යාස, බලශක්තිය, සත්ව-ශාක ආහාර කොටස් සහ ඛනිජ ලවණ අගය එක් කිරීම වැනි අත්‍යවශ්‍ය මාතෘකා කෙරෙහි අවධානය යොමු කරමින් පූර්ව-සමුළු ප්‍රතිපත්ති කෙටුම්පත්කරණය උදෙසා සැලකිය යුතු වෙහෙසක් ගන්නා ලදි.

දැනුම්වත් තීරණ ගැනීම්, කාර්ය සාධන ඇගයීම්, විද්‍යා හා තාක්ෂණ දත්ත රැස් කිරීම සහ උපදේශන සංසදයන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සඳහාද ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් විවිධාකාර වූ ප්‍රවේශයන් අනුගමනය කරන ලදී. ක්‍රියාත්මක කිරීම සඳහා සම්පාදනය කරන ලද අනුමත වාර්තා ලබා දීම සඳහා අවකාශ සලසමින් 2022 ඔක්තෝම්බර් මාසයේදී ආයතනික තක්සේරු නැවත ආරම්භ කිරීමද කැපී පෙනේ. මෙම සමාලෝචන කටයුතු සඳහා විද්වත් මණ්ඩල සහ ආයතන වෙත මාගේ බලවත් ප්‍රශංසාව පුද කරමි. ඒ අනුව, විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව සකස් කිරීමේදී දත්ත ඒකරාශිකරණ ක්‍රියාවලිය ඵලදායී ලෙස තාර්කිකකරණය කිරීමේ අපේක්ෂාවෙන් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව තත්කාලීන දත්ත අත්පත් කර ගැනීම සඳහා විශේෂයෙන් සකසන ලද ඩිජිටල් වේදිකාවක් ගොඩනැගීමේ මූලාරම්භය ගන්නා ලදි.

තවද, තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් සංවිධානය කරන ලද 10 වන වාර්ෂික පර්යේෂණ සමුළුව ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය තුළ හඳුනාගන්නා ලද ප්‍රධාන අංශ 10 සමඟද අනුගත විය. ශ්‍රී ලංකාව තුළ විද්‍යාව හා තාක්ෂණය ඉහළ නංවාලීම සඳහා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කැපවීම ඉස්මතු කරමින් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති ජාතික ප්‍රතිපත්ති රාමුව හා මෙම මූලාරම්භයන් අනුගත වේ.

සහයෝගී තාක්ෂණ හුවමාරු මූලාරම්භයන් ලබාගැනීමේ අරමුණින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් දකුණු කොරියා විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ආයතනය සමග ජාත්‍යන්තර ප්‍රතිපත්ති සහයෝගිතාවයන් සිදු කිරීමේ හැකියාව සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කරනු ලැබ ඇත. මෙම සලකා බැලීම් තුළින් ඉස්මතුවන යම් ධනාත්මක ප්‍රතිඵලයක් වේනම් එමගින් අංශයේ ශක්‍යතාවයන් හා ශක්තීන් නංවාලමින් ආර්ථික ප්‍රතිලාභ ජනනය කිරීමේ විභවයක්ද පවතී.

එබැවින්, මේ සම්බන්ධයෙන් සභාපතිවරයා හට මෙන්ම ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවටද ලබාදුන් මිල කළ නොහැකි මාර්ගෝපදේශකත්වයන් සම්බන්ධයෙන් මාගේ හෘදයාංගම කෘතවේදිත්වය පළ කරමි. තවද, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වටිනාම සම්පත වන කාර්ය මණ්ඩලයේ කැපවීම වෙනුවෙන් ද  මාගේ ප්‍රශංසාව පුද කරමි.

**ගීතානි එස්. කන්නන්ගර**

වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී

## කොමිෂන් සභා සාමාජිකයෝ



**මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න**

**කොමිෂන් සභා සභාපති**

මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න මහතා රසායන විද්‍යාව පිළිබඳ කීර්තිමත් සම්මානනීය මහාචාර්යවරයකු වන අතර දැනට SLTC පර්යේෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපති සහ ප්‍රධාන විධායක නිලධාරියා වේ.

දැනට ඔහු ව්‍යවස්ථාපිත මණ්ඩල ගණනාවක සේවය කරයි.



**දීපා ලියනගේ මහත්මිය**
**කොමිෂන් සභා සාමාජික**

දීපා ලියනගේ මහත්මිය අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්වරියකි



**ආචාර්ය ඩී.එම්. සුරතිස්ස දිසානායක**
**කොමිෂන් සභා සාමාජික**

ෆොසිල ජීව විද්‍යාඥයෙකු වන ආචාර්ය ඩී.එම්.සුරතිස්ස දිසානායක මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ සත්ත්ව විද්‍යා හා පරිසර විද්‍යා අධ්‍යයනාංශයට අනුයුක්තව සේවය කරයි. ඔහු මේවන විට ද්විතීයන පදනම මත ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් කටයුතු කරයි.





**මහාචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර**
**කොමිෂන් සභා සාමාජික**

ජාතික මුලික අධ්‍යයන ආයතනයට අනුයුක්ත පර්යේෂණ මහාචාර්යවරකි.

**ආචාර්ය කේ.ජී.අයි. අමරසිංහ**
**කොමිෂන් සභා සාමාජික**

ආචාර්ය කේ.ජී.අයි. අමරසිංහ මහතා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ හිටපු ලේකම්/ ප්‍රධාන විධායක නිලධාරි වේ.





**ආචාර්ය නිර්මලී ද සිල්වා මහත්මිය**
**කොමිෂන් සභා සාමාජික**

ශ්‍රී ලංකාවේ ඇඟලුම් හා විලාසිතා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පෙරමුණෙහි කටයුතු කොට ඇති ආචාර්ය නිර්මලී ද සිල්වා මහත්මිය වරලත් රෙදිපිළි තාක්ෂණවේදිනියකද වන අතර, තත්ත්ව හා ඵලදායකත්ව සංකල්ප හා සහතිකකරණය පිළිබඳ සංකල්ප ප්‍රවර්ධනය කරන්නියකද වේ.

**තුෂාර වජිර පෙරේරා මහතා**
**කොමිෂන් සභා සාමාජික**

තුෂාර වජිර පෙරේරා මහතා ලංකා රජයේ අතිගරු ජනාධිපතිවරයාගේ විද්‍යා කටයුතු පිළිබඳ උපදේශකවරයෙකි. මේ වන විට ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනයේ (SLINTEC) හා ජාතික විද්‍යා පදනමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් සේවය කරන ඒ මහතා මොරටුව විශ්වවිද්‍යාලයේ කවුන්සිල සාමාජිකයෙකු වේ.

## භාණ්ඩාගාර නියෝජිතයෝ



**ආචාර්ය ඩී.ජී.ජී.එස්. දයානාත් මහතා (2021 සැප්තැම්බර් මස 22 වන දින සිට 2022 දෙසැම්බර් 05 දක්වා )**

ආචාර්ය ඩී.ජී.ජී.එස්. දයානාත් මහතා 2021 සැප්තැම්බර් මස 22 වන දින සිට සිට 2022 දෙසැම්බර් 05 දක්වා) ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මහා භාණ්ඩාගාර නියෝජිතවරයෙකු ලෙස කටයුතු කරන ලදී.



**දිලූපා ප්‍රනාන්දු මහත්මිය**
**භාණ්ඩාගාර නියෝජිත (2022 දෙසැම්බර් 23 සිට)**

දිලූපා ප්‍රනාන්දු මහත්මිය මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙහි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක වේ.

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා කාර්ය මණ්ඩලය – 2022

| | |
|---|---|
| **මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න මහතා** | සභාපති (2022 ඔක්තෝම්බර් 10 දින සිට) |
| **නසීමා අහමඩ් මහත්මිය** | වැඩබලන අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි. (2022 මාර්තු 14 දක්වා) |
| **ජනක එස්. ගීකියනගේ මහතා** | වැඩබලන අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි. (2022 මාර්තු 15 සිට) |
| **සෙයිඩ් ෂාමි මහතා** | ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ |
| **ජී.සී. කුමාරි පීරිස් මිය** | නියෝජ්‍ය අධ්‍යක්ෂ- මුදල් හා පරිපාලන |
| **එම්.ඩී. තිළිණි මිය** | විද්‍යාඥ |
| **රසිතා පෙරේරා මිය** | විද්‍යාඥ |
| **යූ.කේ.ඩී. එල්. එච්. කේ. උඩුගම මිය** | පරිපාලන නිලධාරී |
| **ආර්. එම්. තුසිත රත්නායක මහතා** | වැඩසටහන් සහකාර - මුදල් |
| **එස්. ඒ. ඩී. එස්. පී. සේනානායක මහතා** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ/ දත්ත ගබඩා සහකාර |
| **ඩබ්. එම්. අයි. කේ. වෙදමුල්ල මහත්මිය** | කළමනාකරණ සහකාර (2022 ජුලි 03 දක්වා) |
| **අනිල් හෙට්ටිආරච්චි මහතා** | රියැදුරු |
| **ජයශාන්ත ප්‍රභාත් මහතා** | රියැදුරු |
| **එරන්ද ප්‍රදීප් මහතා** | රියැදුරු |
| **ඒ.ඩී. ධනපාල මහතා** | කාර්යාල කාර්ය සහායක |

## කාර්ය සාධනය පිළිබඳ විශේෂ වැඩසටහන් - 2022

### *ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (1): විද්‍යාව හා තාක්ෂණය දියුණුකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳව රජයට උපදෙස් ලබාදීම*

**01. ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට දේශීය දැක්මක් අන්තර්ගත කිරීම**

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනය (BMARI) සමාලෝචනය පිණිස පත් කරන ලද සමාලෝචන මණ්ඩලය විසින් ජාතික දේශීය සෞඛ්‍ය/ආයුර්වේද ප්‍රතිපත්තියක අවශ්‍යතාවය නිර්දේශ කරන ලදී. මෙමගින් දේශීය වෛද්‍ය/ආයුර්වේද ඖෂධ සංග්‍රහයක් සකස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සකසනු ඇත. ඒ අනුව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් මෙම අවශ්‍යතාවය පිළිබඳ අදාළ බලධාරීන් වෙත සන්නිවේදනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සෞඛ්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා නියෝජනයද සහිත මෙහෙයුම් කාරක සභාවක් හා ප්‍රතිපත්ති සම්පාදන කමිටුවක්ද පත් කරන ලදී. මෙම කමිටු විසින් 2023 වසර තුළ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු පිණිස යෝජිත ප්‍රතිපත්තිය කෙටුම්පත් කොට අවසන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

**02.** 2018 වසර තුළ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් කෙටුම්පත් කරන ලද ජාතික ජීනෝම ද්‍රව්‍ය මධ්‍යස්ථාන හා ජාතික ජීනෝම දත්ත සුරක්ෂිතාගාරය ගොඩනැගීමේ ප්‍රතිපත්ති කෙටුම්පත් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමේ අදහසින් නැවත ආරම්භ කරනු ලැබ ඇත. ප්‍රතිපත්ති සම්පාදන විශේෂඥ කමිටුවද සමගින් මේ සම්බන්ධයෙන් රැස්වීම් ගණනාවක් පවත්වන ලදුව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමේ කාර්යය කඩිනම් කරනු පිණිස විද්‍යා හා තාක්ෂණ විෂය භාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.

**03.** 2023 - ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුවට අදාල පූර්ව කටයුතු වශයෙන් ක්‍රියාත්මක විය යුතු බවට හඳුනාගෙන ඇති පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් තාක්ෂණික වාර්තා ලෙස ප්‍රතිපත්ති නිර්දේශ හතරක් සම්බන්ධයෙන් කටයුතු අඛණ්ඩව සිදු කෙරුණි.

- අ. කාලගුණ විපර්යාස, කෘෂිකර්මය හා ආහාර සුරක්ෂිතතාව
- ආ. ශ්‍රී ලංකාවට ආවේණික ජෛව සම්පත්වලින් සැකසුණු පෝෂණ වෛද්‍ය ද්‍රව්‍ය (Nutraceuticals) සහ ප්‍රධාන ඖෂධීය සංයෝග
- ඇ. ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත්, ඛනිජද්‍රව්‍ය හා ඒවාට අගය එකතු කිරීම
- ඈ. පුනර්ජනනීය බලශක්තිය, හරිත හයිඩ්‍රජන්, සහ බලශක්ති ගබඩාකරණය

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (2): ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ කටයුතු සමාලෝචනය කරමින් රජයට වාර්ෂිකව වාර්තාවක් ඉදිරිපත් කිරීම

පෙර වසරේ ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්‍ෂණ ක්‍රියාකාරකම් සමාලෝචනය කරමින් වාර්ෂිකව රජයට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත නියම කරනු ලැබ ඇත. මානව සම්පත් සංවර්ධනය, විද්‍යා හා තාක්ෂණ ආයතන කාර්යසාධනය, විද්‍යා හා තාක්ෂණ කටයුතු විෂයයෙහි රජයේ වියදම්වල ඵලදායකත්වය සහ රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ ආයතන විසින් විද්‍යාව හා තාක්ෂණය උපයෝගී කරගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ගයන්හි ඵලදායකත්වය සම්බන්ධ තක්සේරුවක් මෙම වාර්තාව තුළ අන්තර්ගත වේ.

➤ **2019-2020 සහ 2021 වසරවලට අදාළ විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාව**

2019-2020 සඳහා දත්ත ඒකරාශිකරණ ක්‍රියාවලිය හා දත්ත විශ්ලේෂණයද සම්පූර්ණ කරන ලදී. අදාළ වාර්තාවන්හි මූලික කෙටුම්පත් සංස්කරණයන් සම්පාදනය කරන ලදී. තත්කාලීන දත්ත ඇතුලත් කිරීම සහතික කිරීම උදෙසා මෙතෙක් පැවති දත්ත ලේඛනගත කිරීම වෙනුවට දත්ත රැස්කිරීමේ ඩිජිටල් වේදිකාවක් සකසන ලදී.

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (3): විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම

පනතේ 2 වගන්තිය තුළ දක්වා ඇති අරමුණු සම්බන්ධයෙන් විද්‍යා හා තාක්ෂණ ආයතනයන් සමාලෝචනය කිරීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත නියම කරනු ලැබ ඇත.

මෙම ආයතනයන් විසින් ජාතික ප්‍රමුඛතා හා ඉලක්ක සපුරාලනු ලබන බවට සහතික කරනු පිණිස ඔවුන් විසින් සිදුකරනු ලබන විද්‍යා හා තාක්ෂණ කටයුතුවල ගුණාත්මකභාවය, පිරිවැය ඵලදායකත්වය, අදාළත්වය හා බලපෑමද තක්සේරු කරනු වස් කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව හා අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන්ගෙන් සමන්විත වන පරිදි ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් පත්කරන ලද බාහිර මණ්ඩලයක් විසින් සමාලෝචනයන් සිදුකරනු ලබයි. සමාලෝචන අත්පොත හා අදාළ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ස්වයං ඇගයුම් වාර්තාව (SAR) පදනම් කරගනිමින් සමාලෝචනය සිදු කෙරේ. පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසමින් අතිරේක තොරතුරු ඒකරාශි කිරීම සිදුකරනු ලබයි.

සමාලෝචන ක්‍රියාවලිය සුවිශේෂී අදියර සතරකින් සමන්විත වේ.

- සමාලෝචනයට සූදානම් වීම
- සමාලෝචන කණ්ඩායම විසින් ආයතනයන්හි සිදුකරන චාරිකා
- සමාලෝචන කණ්ඩායම විසින් වාර්තා කෙටුම්පත සකස් කිරීම
- සමාලෝචන කණ්ඩායම විසින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත අවසන් සමාලෝචන වාර්තාව සහතික කොට ඉදිරිපත් කිරීම

සභාපති හා කොමිෂන් සභාව පත් කරනු ලබන තුරු ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ ආයතනික සමාලෝචන ක්‍රියාවලිය තාවකාලිකව නතර කරන ලදී. 2022 ඔක්තෝබර් මාසයේදී නව කොමිෂන් සභාව පත් කිරීමත් සමගින් ක්‍රියාවලිය නැවත ආරම්භ කරන ලදී. කොමිෂන් සභාව විසින් 2019-2021සිදුකරන ලද පහත සඳහන් සමාලෝචන වාර්තා සඳහා අනුමැතිය ලබාදෙන ලදී.

1. ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD)
2. ජාතික විද්‍යා පදනම (NSF)
3. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC)
4. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)
5. කාර්මික තාක්ෂණ ආයතනය (ITI)
6. රබර් පර්යේෂණ ආයතනය (RRI)

2022 නොවැම්බර් මස 24 වන දින ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේදී පවත්වන ලද විශේෂ උත්සවයකදී මෙම වාර්තා අධ්‍යාපන අමාත්‍ය ගරු ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත මහතා වෙත නිල වශයෙන් භාරදෙන ලදී.



*රූපය 3 : නස්ටෙක් සමාලෝචන වාර්තා ගරු අමාත්‍යතුමාට නිලවශයෙන් ප්‍රදානය කිරීම*

2022 වසර සඳහා නව ආයතනික සමාලෝචන ආරම්භ කළ නොහැකි වූ බැවින්, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සමාලෝචන තොරතුරු ආශ්‍රිත මූලික විශ්ලේෂණයක්, සමාලෝචිත ආයතනය සඳහා අධීක්ෂණ හා ඇගයීමේ ක්‍රමයක් සහ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සමාලෝචන අත්පොත සඳහා පරිශීලක මාර්ගෝපදේශ ගොඩනැගීම වැනි සෙසු ලේඛන කාර්යයන් කෙරෙහි සිය අවධානය යොමු කරන ලදී.

විද්‍යා හා තාක්ෂණ ආයතනයන් විසින් නොකඩවා සිය කටයුතුවල නිරත වීම දිරිමත් කරවීමේ අරමුණින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරන ලද ආයතන වෙත 2023 මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිත විද්‍යා හා තාක්ෂණ ද්වි-වාර්ෂික සමුළුවේදී, විශිෂ්ට කාර්යසාධන සම්මාන දෙකක් පිරිනැමීමට කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඒ සඳහා ලකුණු දීමේ නිර්ණායක සකස්කරන ලදී.

## *ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ කර්තව්‍ය (4): විද්‍යා හා තාක්ෂණ ආයතනයනට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ රජයට උපදෙස් ලබාදීමට ප්‍රථම අදාළ විද්‍යා හා තාක්ෂණ ආයතන විමසීම*

**ප්‍රතිපත්තිවල පවත්නා අඩු ලුහුඩුකම් සහ අවශ්‍යතා හඳුනාගනු පිණිස විද්‍යාඥයන්, ඉංජිනේරුවන් සහ පර්යේෂකයන්ගේ සහය ලබාගැනීම**

### 01. ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය (SSF)

ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය වූ කලි ශ්‍රී ලංකාවේ විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන (STI) ආශ්‍රිත ප්‍රතිපත්ති හා සමාලෝචන සකස් කිරීමෙහි නියුක්ත විද්‍යාඥයන් ඇතුළත් කරගනිමින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයේ සහයෝගිතාවය දිරි ගන්වමින් ශක්තිමත් කිරීමේ අරමුණු සහිතව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් ආරම්භ කරන ලද උපදේශක සංසද අතරින් එකකි. 2001 වසරේ ආරම්භ කරන ලද ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය 2010 වසර දක්වා වසර දහයක කාලයක් පුරා සක්‍රීයව පැවතිණි. විවිධ අභියෝග හේතුකොට 2011 සිට 2020 දක්වා කාල පරිච්ඡේදය පුරා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයන්ගේ සංසදය ක්‍රියාත්මක නොවුනි. සංසදය 2021 වසර තුළ නැවත ක්‍රියාත්මක කරන ලදී.

- ජාතික විද්‍යා දින සැමරුම් හා සමාන්තරව 2022 නොවැම්බර් මාසය සඳහා සංසදය විසින් මාර්ගගත වැඩසටහන් දෙකක් සංවිධානය කරන ලදී. මෙම කර්තව්‍යයන් "විද්‍යා, තාක්‍ෂණ සහ නවෝත්පාදන රාජ්‍ය තාන්ත්‍රිකත්වය" පිළිබඳ කෙටි කථිකාවකින් සහ Introduction to Scientometrics පිලිබඳ සහතික පත්‍ර වැඩමුළුවකින් සමන්විත විය. එවා පිළිවෙලින් විෂයගත විදේශීය ආයතන වන ජාත්‍යන්තර විද්‍යා සභාවේ විශේෂඥවරයෙකුගේ හා ඉන්දියාවේ විද්‍යා හා තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්ති පර්යේෂණ කේන්ද්‍රයේ සහයෝගය සහිතව සංවිධානය කරන ලදී. පැමිණි අනුපිළිවෙල මත අවස්ථාව ලබාදීමේ පදනමින් මෙම අවස්ථාවට විද්‍යාඥයින් 100කට වැඩි ප්‍රමාණයක් සහභාගී විය.

### 02. තරුණ විද්‍යාඥයන්ගේ සංසදය (YSF)

ජාලගතකරණය සඳහා අවශ්‍ය ඉඩ හසර නිර්මාණය කරන අතරතුර දැනුම බෙදාහදා ගැනීම සඳහා අවශ්‍ය වේදිකාවක් නිර්මාණය කරනු පිණිස ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයන්ගේ සංසදය වෙත අවස්ථාවක් ලබාදීමේ අදහසින් 2000 වසරේ සිට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් තරුණ විද්‍යාඥයන්ගේ සංසදයට අවශ්‍ය සත්කාරකත්වය ලබාදෙමින් පවතී. තරුණ විද්‍යාඥයන්ගේ සංසදය මේ වන විට විවිධ ක්ෂේත්‍රයන්ට අදාල සාමාජිකයින් 400 කට වැඩි ප්‍රමාණයකින් සමන්විත වේ.

#### *I. <u>තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මෙහෙයුම් කමිටුව (YSF)</u>*

තරුණ විද්‍යාඥයන්ගේ සංසදය සාමාජිකයන් 13 දෙනෙකුගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවකින් සමන්විත වේ. මෙහෙයුම් කමිටුව සභාපතිවරයෙකුගේ පාලනය යටතේ ක්‍රියාත්මක වන අතර ඔහුට සම ලේකම්වරුන් දෙදෙනෙකුගේ සහාය ලැබේ. සෑම වසරකම වාර්ෂික මහා සභා රැස්වීමේදී (AGM) නව මෙහෙයුම් කමිටුවක් තෝරා පත්කර ගනු ලබයි. මාර්ගගත රැස්වීමක් ලෙස 2022 මාර්තු මස 18 වන දින පවත්වන ලද වාර්ෂික මහාසභා රැස්වීමේදී 2022 මෙහෙයුම් කමිටුව තෝරා පත්කර ගන්නා ලදී.

## II. තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ වාර්ෂික පර්යේෂණ සමුළුව

ජාලගතකරණය හා තාක්ෂණික-ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ඉඩ හසරක් නිර්මාණය කරමින් විවිධ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ තොරතුරු හා පර්යේෂණ අභිලාශයන්ද බෙදාහදා ගනිමින් සහයෝගිතා පර්යේෂණ ප්‍රවර්ධනය කරනු පිණිස තරුණ විද්‍යාඥයන් වෙත වේදිකාවක් සම්පාදනය කිරීමේ ප්‍රධාන අරමුණ සහිතව 2012 වසරේදී ආරම්භ කරන ලද තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ පර්යේෂණ සමුළුව මේවන විට ජනප්‍රිය වැඩසටහනක් බවට පත්ව ඇත.

සමුළුවේ දස වසර සැමරුමද සමගින් මාර්ගගත වැඩසටහනක් ලෙස 2022 මාර්තු මස 18 වන දින සිය දසවන වාර්ෂික පර්යේෂණ සමුළුව පැවැත්වීමට ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සැලසුම් කරන ලදී. දීර්ඝ පර්යේෂණ සාරාංශ (EA) සහ සම්මන්ත්‍රණ පත්‍රිකා (FP) යන පර්යේෂණ පත්‍රිකා වර්ග දෙකම පිළිගනු ලැබීය. පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලෙස සිදුකරන ලද ඇරයුමට අනුව සෞඛ්‍ය, ආහාර, පෝෂණය හා කෘෂිකර්මය, පරිසරය, ජලය, බලශක්තිය, නිවාස, ඛනිජ සම්පත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ දැනුම් සේවා, මූලික විද්‍යා, සහ නවීන තාක්ෂණයන් හා දේශීය දැනුමද ඇතුළත්ව ජාතික පර්යේෂණ හා සංවර්ධන රාමුව තුළ හඳුනාගන්නා ලද විශේෂ ක්ෂේත්‍ර දහයකට අදාළ පර්යේෂණ සාරාංශ 57ක් හා සම්මන්ත්‍රණ පත්‍රිකා 23ක්ද අන්තර්ගත පර්යේෂණ පත්‍රිකා 80ක් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව වෙත ලැබිණි. සෑම පත්‍රිකාවක්ම ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් දෙදෙනෙකු විසින් කර්තෘ-සමාලෝචක තොරතුරු අප්‍රකාශිත සමාලෝචන ක්‍රියාවලියක් මත ඇගයීමට ලක් කරන ලද අතර, පර්යේෂණ සාරාංශ (EA) 39ක් සහ සම්මන්ත්‍රණ පත්‍රිකා (FP) 17ක් ඇතුළුව පත්‍රිකා 56 ක් මාර්ගගත වේදිකාව හරහා සම්මන්ත්‍රණයට ඉදිරිපත් කිරීමට තෝරා ගන්නා ලදී. තෝරාගත් පත්‍රිකා විද්‍යුත් ග්‍රන්ථයන් ලෙස ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

මෙම සම්මන්ත්‍රණයේ සමාරම්භක උත්සවයේ ගෞරවනීය ආරාධිත අමුත්තා ලෙස ඩිජිටල් තාක්‍ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජයන්ත ද සිල්වා මහතා විසින් උත්සව සභාව අමතන ලද අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රතිශක්තිකරණ හා අණුක වෛද්‍ය විද්‍යා අංශයේ මහාචාර්ය සහ ප්‍රධානී මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය විසින් "ආර්ථික අර්බුදකාරී අවස්ථාවක බලපෑම් සහගත පර්යේෂණ" යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය ඉදිරිපත් කරන ලදී.

2022 වසරේ අවසන් කාල පරිච්ඡේදය තුළ තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් සිය 11 වන තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ පර්යේෂණ සම්මන්ත්‍රණය 2023 වසරේ ජනවාරි මාසයේදී පැවැත්වීමට සැලසුම් කරන ලද අතර පර්යේෂණ සාරාංශ හා සම්මන්ත්‍රණ පත්‍රිකා යන දෙවර්ගයම කැඳවන ලද අතර පර්යේෂණ සාරාංශ 41කින් හා සම්මන්ත්‍රණ පත්‍රිකා 19කින් සමන්විත පර්යේෂණ පත්‍රිකා 60ක් ලැබිණි. සෑම පත්‍රිකාවක්ම ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයින් දෙදෙනෙකු විසින් කර්තෘ-සමාලෝචක තොරතුරු අප්‍රකාශිත සමාලෝචන ක්‍රියාවලියක් මත ඇගයීමට ලක් කරන ලද අතර, පර්යේෂණ සාරාංශ (EA) 36ක් සහ සම්මන්ත්‍රණ පත්‍රිකා (FP) 17ක් ඇතුළුව පත්‍රිකා 53 ක් 2023 ජනවාරි මාසයේදී මාර්ගගත වේදිකාව හරහා සම්මන්ත්‍රණයට ඉදිරිපත් කිරීමට තෝරා ගන්නා ලදී.

## III. රටතුළ පවත්නා ජාතික ප්‍රමුඛතා හා රට තුල පවත්නා ගැටලු සම්බන්ධ දැනුම්වත් කිරීමේ මාර්ගගත සම්මන්ත්‍රණය

තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් 2022 ක්‍රියාකාරී සැලැස්මේ කොටසක් වශයෙන් මාර්ගගත සම්මන්ත්‍රණ පෙළක් සංවිධානය කරන ලදී. මෙම මාර්ගගත සම්මන්ත්‍රණවල ප්‍රධාන අරමුණ වනුයේ රටේ වත්මන් හා නැගී එන විද්‍යාත්මක කටයුතු සම්බන්ධයෙන් තරුණ විද්‍යාඥයන් අතර දැනුම්වත්භාවය ඇති කරමින් දැනුම ප්‍රචාරය කරවීමයි. උක්ත අරමුණ මත පදනම්ව 2022 වසර තුළ දැනුම්වත් කිරීමේ මාර්ගගත සම්මන්ත්‍රණ තුනක් සංවිධානය කරන ලදී.

**i)** **ශ්‍රී ලංකාවේ ආහාර අර්බුදය සඳහා අවම භාවිත හා නොසලකා හරින ලද භෝග විශේෂ යොදාගනිමින් ලබාදිය හැකි විසඳුම් පිලිබඳ YSF මාර්ගගත සම්මන්ත්‍රණය**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් සංවිධානය කරන ලද මාර්ගගතව දැනුම හුවමාරු කරගැනීමේ සැසි මාලාවේ පළමුවන මාර්ගගත සම්මන්ත්‍රණය 2022 ජූලි මස 05වන දින නොකඩවා දෙවන වසර ලෙස 2022 වසර තුළද පැවැත්වූණි. මෙම වෙබ් සම්මන්ත්‍රණය 'ශ්‍රී ලංකාවේ ආහාර අර්බුදය සඳහා අවම භාවිත හා අත්හරින ලද භෝග විශේෂ යොදාගනිමින් ලබාදිය හැකි විසඳුම්' පිළිබඳ යොමුවූවක් වූ අතර,පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ භෝග විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය ගාමිණී පුෂ්පකුමාර මහතා විසින් ශ්‍රී ලංකාව තුළ දැනට පවත්නා ඉඩම් පරිහරණ ක්‍රම භාවිතයෙන් සුළු හා නොසලකා හරින ලද භෝග විශේෂ හරහා දැනට පවත්නා ආහාර අර්බුදය ජයගැනීමේ ප්‍රවේශයන් පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරමින් එහි ආරාධිත දේශක හා සම්පත් දායකවරයා වශයෙන්ද මාර්ගගතව සභාව අමතන ලදී. 60 දෙනෙකුගෙන් පමණ සහභාගිත්වයෙන් යුතුව පැවති ප්‍රශ්නෝත්තර සැසියකින් අනතුරුව මාර්ගගත සම්මන්ත්‍රණය සාර්ථකව අවසන් විය.




*රූපය 4 : ඇතිවිය හැකි ආහාර අර්බුදයකදී ලබාදිය හැකි ආහාර විසඳුම් සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය*

**ii)** **ඩෙංගු වයිරස් ආසාදනයනට අදාළ මානව ප්‍රතිශක්තිය සම්බන්ධ තරුණ විද්‍යාඥයින්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය**

2022 වසරේ නොකඩවා දෙවන වරටත් පවත්වන ලද ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් සංවිධානය කරන ලද මාර්ගගතව දැනුම හුවමාරු කරගැනීමේ සැසි පෙළක දෙවන සම්මන්ත්‍රණය 2022 අගෝස්තු මස 22වන දින පැවැත්විණි. 'ඩෙංගු වෛරස් ආසාදනයනට අදාළ මානව ප්‍රතිශක්තිය' යන ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමු කරමින් ආරාධිත දේශකයා හා සම්පත් දායකවරයාද වශයෙන් ඉන්දියාවේ නවදිල්ලි නුවර ජාන ඉංජිනේරු හා ජෛව තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය වන එමරි එන්නත් මධ්‍යස්ථානයේ කණ්ඩායම් නායක ආචාර්ය අන්මෝල් චන්දිලි මහත්මිය විසින් පවත්වන ලද වෙබ් සම්මන්ත්‍රණයට මාර්ගගතව සහභාගි වූ පිරිස අමතා අදහස් දක්වන ලදී. 30 දෙනෙකුගේ පමණ සහභාගිත්වයෙන් යුතුව පැවති වෙබ් සම්මන්ත්‍රණය ප්‍රශ්නෝත්තර සැසියකින් අනතුරුව සාර්ථකව අවසන් විය.




*රූපය 5 : ඩෙංගු වෛරස් ආසාදනයනට අදාළ මානව ප්‍රතිශක්තිය' සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වෙබ් සම්මන්ත්‍රණය*

### iii) තිරසරභාවය කරා යොමුවූ නව සොයාගැනීම්/ නවෝත්පාදන සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ මාර්ගගත සම්මන්ත්‍රණය

2022 වසරේ නොකඩවා දෙවන වරටත් පවත්වන ලද ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් සංවිධානය කරන ලද මාර්ගගතව දැනුම හුවමාරු කරගැනීමේ සැසි පෙළක තුන්වන වෙබ් සම්මන්ත්‍රණය 2022 ඔක්තෝබර් මස 19වන දින පැවැත්විණි. 'තිරසරභාවය කරා යොමුවූ නව සොයාගැනීම්/ නවෝත්පාදන' යන මැයෙන් පවත්වන ලද මෙම වෙබ් සම්මන්ත්‍රණයේ ආරාධිත දේශකයා හා සම්පත් දායකවරයාද වශයෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ සිවිල් ඉංජිනේරු මහාචාර්ය රංගික හල්වතුර මහතා විසින් මාර්ගගතව සහභාගිවූ පිරිස අමතන ලදී. ප්‍රශ්නෝත්තර සැසියකින් අනතුරුව වෙබ් සම්මන්ත්‍රණය සාර්ථකව අවසන් විය.





*රූපය 6 : තිරසරබව කරා යොමුවූ නව සොයාගැනීම්/ නවෝත්පාදන සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වෙබ් සම්මන්ත්‍රණය*

## *IV. තරුණ විද්‍යාඥයන් සඳහා වූ නිපුණතා සංවර්ධන වැඩමුළුව*

තරුණ විද්‍යාඥයන්ගේ විවිධ ක්ෂේත්‍රයනට අදාළ හැකියාවන් හා කුසලතාවයන් නංවාලීමට උපකාර කරනු පිණිස තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් නිපුණතා සංවර්ධන මාර්ගගත වැඩමුළු පෙළක්ද සැලසුම් කරන ලදී.

## i. ජීනෝමය ගවේෂණය පිණිස ජාන සළකුණුකරණයන් සැලසුම් කිරීම සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ නිපුණතා සංවර්ධන වැඩමුළුව


ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් සංවිධානය කරන ලද මාර්ගගත වැඩමුළු පෙළක පළමු නිපුණතා සංවර්ධන වැඩමුළුව 2022 ජූලි මස 29 වන දින පවත්වන ලදී. ‘ජීනොමය ගවේෂණය පිණිස ජාන සළකුණුකරණයන් සැලසුම් කිරීම’ අරමුණු කරගනිමින් වැඩමුළුව පැවැත්වුණු අතර මේ සඳහා උනන්දුවක් දැක්වූ 30 කට අධික සංඛ්‍යාවකගේ සහභාගිත්වය සහිතව පැවැත්වුණු එම මාර්ගගත වැඩමුළුවේ සම්පත් දායකයා වශයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කෘෂිකාර්මික ජීව විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය දිමන්ති ජයතිලක මහත්මිය විසින් වැඩමුළුව පවත්වන ලදී.




*රූපය 7 : ජීනෝමය ගවේෂණය පිණිස ජානමය සළකුණුකරණයන් සම්බන්ධ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වැඩමුළුව*

## ii. ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදානයන් ලබාගනු පිණිස උපායමාර්ග පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ නිපුණතා සංවර්ධන වැඩමුළුව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් සංවිධානය කරන ලද මාර්ගගත වැඩමුළු පෙළක දෙවන නිපුණතා සංවර්ධන වැඩමුළුව 2022 සැප්තැම්බර් මස 20 වන දින පවත්වන ලදී. මෙම වැඩමුළුව තුළ ‘ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදානයන් ලබාගැනීමේ ක්‍රමෝපායන්’ පිළිබඳ අවධානය යොමුකරන ලද අතර, 90 දෙනෙකුට වැඩි පිරිසක් සහභාගිවූ එම මාර්ගගත වැඩමුළුවේ සම්පත් දායකයන් වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහාචාර්ය මෙත්තිකා විතානගේ සහ ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ ආචාර්ය හසින්ත විජේසේකර සහභාගී විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආචාර්ය අනුෂ්ක යූ. රාජපක්ෂ විසින් මෙම අවස්ථාව සම්බන්ධීකරණය කරන ලදී.





*රූපය 8 : ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදානයන් ලබාගැනීම සඳහා වූ ක්‍රමෝපාය පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ වැඩමුළුව*

## V. රටේ පවත්නා ජාතික ප්‍රමුඛතා හා ගැටලු පිළිබඳ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ ප්‍රකාශන මාලාව

තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් 2021 වසරේදී එහි ප්‍රධාන කටයුතු අතරින් එකක් වශයෙන් පරිච්ඡේද විද්‍යුත් කෘතියක් (Chapter e book) පළ කිරීමේ කාර්යය ආරම්භ කරන ලද අතර, එම කාර්යය 2022 දක්වා අඛණ්ඩව පවත්වාගෙන එන ලදී. මෙම විද්‍යුත් කෘතියේ ප්‍රධාන අරමුණ වූයේ හඳුනාගත් මාතෘකාවක් සම්බන්ධයෙන් පවත්නා තොරතුරු පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් සම්පාදනය කරමින් ප්‍රතිපත්තිමය අඩුලුහුඩුකම් හඳුනා ගැනීමයි. මෙම සමාලෝචනය මත පදනම්ව, තරුණ විද්‍යාඥයන් හට ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් වීම සඳහා අවකාශයක් නිර්මාණය වන අතර ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලීන් තුළට විද්‍යාත්මක පැතිකඩයන් ඇතුළත් කරනු පිණිස නව ප්‍රතිපත්ති ක්ෂේත්‍ර හඳුනා ගත හැකිය.

විද්‍යුත් කෘතිය "පරිසර තිරසරබව හා ආහාර සුරක්ෂිතතාව:ශ්‍රී ලංකාව සඳහා වඩාත් ශක්තිමත් ප්‍රතිපත්ති මූලාරම්භයන්හි අවශ්‍යතාව" නමින් වන අතර උක්ත ශීර්ෂය යටතේ විවිධාකාර මාතෘකාවන් විෂය කරගනිමින් ලියැවුණු පොත් පරිච්ඡේද 11ක් තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ සාමාජිකයන් වෙතින් ලැබී තිබුණි. මනා සමාලෝචන ක්‍රියාවලියකින් අනතුරුව ඒවා පරිච්ඡේද විද්‍යුත් කෘතියක් ලෙස සම්පාදනය කරන ලදී. ජාත්‍යන්තර ප්‍රමිති කෘති අංකයක් (ISBN) සහිත විද්‍යුත් කෘතිය 2022 මාර්තු මස 18 වන දින පවත්වන ලද දසවන තරුණ විද්‍යාඥයන්ගේ සංසද සමුළුවේදී එළි දක්වන ලදී.




*රූපය 9 : තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ තේමාත්මක විද්‍යුත් ප්‍රකාශනය - පරිසර තිරසරබව සහ ආහාර සුරක්ෂිතතාව*

පළමු විද්‍යුත් කෘතිය සාර්ථක ලෙස පළ කිරීමෙන් අනතුරුව 2022 වසරේදී තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් "ශ්‍රී ලංකාවේ පවත්නා අර්බුදකාරී තත්ත්වය හමුවේ ආර්ථික විකාශනය වේගවත් කිරීමෙහි ලා බහු ආංශික ප්‍රවේශයන්" නමැති ශීර්ෂය යටතේ වූ තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ දෙවන තේමාත්මක ප්‍රකාශනය සඳහා අවශ්‍ය කෘති පරිච්ඡේදයන් ද ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටින ලද අතර, සම්පාදනය කරන ලද ප්‍රකාශනය 2023 තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ සමුළු අවස්ථාවේදී එළි දැක්වෙනු ඇත.

රටේ පවත්නා ජාතික ප්‍රමුඛතාවයන් හා වත්මන් විද්‍යා හා තාක්ෂණ ගැටලු ඉස්මතු කරන්නාවූ විද්‍යාත්මක ලිපි ඉදිරිපත් කරන ලෙසද තරුණ විද්‍යාඥයන්ගේ සංසදය විසින් සිය සාමාජිකත්වයෙන් ඉල්ලා සිටින ලද අතර, 2022 වසරේදී ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභා වෙබ් අඩවියෙහි එවන් ලිපි තුනක් පළ කරන ලදී.

***VI. <u>තරුණ විද්‍යාඥ සම්මානය</u>***

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් සෑම වසරකම තරුණ විද්‍යාඥයන්ගේ සංසදයෙන් තෝරාගනු ලැබූ කැපී පෙනෙන තරුණ විද්‍යාඥයෙකු වෙත තරුණ විද්‍යාඥ සම්මානය පිරිනමනු ලබයි. කොමිෂන් සභාව විසින් පත්කරන ලද අනු කාරක සභාවේ තීරණය ප්‍රකාර, මෙහි අවශ්‍යතා මත සිදු කෙරෙන පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ අභිලාශය ප්‍රධාන කොටගෙන 2021 වසරේ සිට "පර්යේෂණ සඳහා වූ තරුණ විද්‍යාඥ සම්මානය" සහ "තාක්ෂණය සඳහා වූ තරුණ විද්‍යාඥ සම්මානය" ලෙස කාණ්ඩ දෙකක් යටතේ තරුණ විද්‍යාඥ සම්මානය පිරිනැමීමට තීරණය කරන ලදී. සම්මාන දෙකක් සඳහා තෝරාගැනීමේ නිර්ණායක සඳහා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය සමාලෝචනය කොට අවසන් කිරීමෙන් අනතුරුව ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් මෙම ක්‍රියාවලියට අදාළ සම්මාන සඳහා අයදුම් කරනු පිණිස ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයන්ගෙන් අයදුම්පත් කැඳවන ලදී. 2022 වසර වනවිට අයදුම්පත් 42ක් ලැබී තිබූ අතර, ඒවා සුදුසුකම් අනුව ලයිස්තුගත කරන ලදි. කොමිෂන් සභාව විසින් පත්කරන ලද විශේෂඥ මණ්ඩලයක් විසින් ඒවාට අදාළ නිර්ණායක මත පදනම්ව එක් එක් කාණ්ඩයෙන් එක් සම්මානලාභියා බැගින් තෝරාගන්නා ලදී. තරුණ විද්‍යාඥ සම්මාන දෙක 2023 මාර්තු මස පැවැත්වීමට නියමිත ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුවේදී පිරිනැමීමට කටයුතු කෙරෙනු ඇත.

## ජාත්‍යන්තර කටයුතු

### *නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre)*

1989 වසරේ අගෝස්තු මාසයේ සිට ඉන්දියාවේ ස්ථානගතව පවත්නා අන්තර් රාජ්‍ය සංවිධානයක් වන නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය (NAM S&T Centre, www.namstct.org) විසින් විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයනට අදාළව දකුණු-දකුණු සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීමෙහිලා අතිශයින් සක්‍රීය කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ලතින් ඇමරිකානු, අප්‍රිකානු, ආසියානු හා යුරෝපානු මහාද්වීප පුරා විහිද ඇති මෙම මධ්‍යස්ථානයේ ප්‍රෞඪ සාමාජික රටවල් 47 අතරට ශ්‍රී ලංකාවද අයත් වේ. එමගින් සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල් සමගින් විද්‍යාඥයන්, තාක්ෂණවේදීන් හා විද්‍යාත්මක සංවිධාන අතර අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සැලසෙන්නාවූ සහයෝගිතාවය ලබාගැනීමේ වරප්‍රසාදය ලබාදෙනු ලබයි. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ ශ්‍රී ලංකාව සඳහා වූ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය වශයෙන් කටයුතු කරයි.


මේ දක්වා නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාව තුළ පැවැත්වූ එවන් ජාත්‍යන්තර පාඨමාලාවන් හතක්ද ඇතුළත්ව විද්‍යා හා තාක්ෂණ මාතෘකා ගණනාවක් යටතේ විවිධ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ජාත්‍යන්තර වැඩමුළු 91ක් පමණ හා පුහුණු පාඨමාලා 45ක් පමණ සංවිධානය කර ඇත. ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන් බොහෝ පිරිසක්ද ඇතුළත්ව ලොව පුරා සිටින්නාවූ පර්යේෂකයන් හා වෘත්තිකයන් විශාල සංඛ්‍යාවක් වෙත මෙම පාඨමාලාවන් වෙතින් ප්‍රතිලාභ සැලසී ඇත.

**I. නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15 වන පාලක සභාවේ දෙවන කාර්යාංශ රැස්වීම**

නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15 වන පාලක සභාවේ දෙවන කාර්යාංශ රැස්වීම පලස්තීන රාජ්‍යයේ නවෝත්පාදන හා විශිෂ්ටත්ව උසස් සභාවේ (HCIE) අනුග්‍රහය මත 2022 සැප්තැම්බර් මස 21 වන දින මාර්ගගත ක්‍රමයට පවත්වන ලදී. නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ

සාමාජික රටවල සම්බන්ධිකරණ මධ්‍යස්ථාන; ඊජිප්තුව, දකුණු අප්‍රිකාව සහ ශ්‍රී ලංකාව යන රටවල තානාපති කාර්යාල නියෝජිතවරුන්; HCIEහි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්; සහ නොබැඳි ජාතීන්ගේ හා සෙසු සංවර්ධනය වෙමින් පවත්නා රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථාන ලේකම් කාර්යාලයේ නියෝජිතයෝද ඇතුලත්ව රටවල් 12ක නියෝජිතවරුන් 44 දෙනෙකු මෙම රැස්වීමට සහභාගි වූහ.

ආරම්භක සැසියෙන් අනතුරුව, කාර්යාංශ රැස්වීමේ ක්‍රියාකාරී මට්ටමේ සාකච්ඡාවට ශ්‍රී ලංකාව (සභාපති), ඊජිප්තුව (උප සභාපති), මොරිෂීස් (උප සභාපති), පලස්තීනය (උප සභාපති) යන රටවල නියෝජිතවරුන්ද; නොබැඳි ජාතීන්ගේ සාමාජික රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ විවිධ සාමාජික රටවල සම්බන්ධීකරණ මධ්‍යස්ථාන හා සෙසු නියෝජිතයන්; සහ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් සහ ලේකම් කාර්යාලයේ සෙසු නිලධාරින්ද සහභාගි වූහ. නොබැඳි ජාතීන්ගේ සාමාජික රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15 වන සැසිවාරයේ සභාපති සහ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එම්. එන්. රණසිංහ මහතාගේ සභාපතිත්වය යටතේ රැස්වීම පැවැත්විණි. ශ්‍රී ලංකාවේ නොබැඳි ජාතීන්ගේ රටවල මධ්‍යස්ථානයේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ නියෝජිත වශයෙන් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වැඩබලන අධ්‍යක්ෂ ජනක එස්. ගීකියනගේ මහතාද ඊට අමතරව එහි විද්‍යාඥයින්ද මෙම රැස්වීමට සහභාගි විය.




*රූපය 10 : නොබැඳි ජාතීන්ගේ සාමාජික රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානයේ 15 වන පාලක සභාවේ දෙවන කාර්යාංශ රැස්වීම*

නොබැඳි ජාතීන්ගේ සාමාජික රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරනු ලබන වැඩමුළු, සමුළු, සම්මන්ත්‍රණ හා සෙසු කෙටි කාලීන හා මැදි කාලීන පුහුණු වැඩසටහන්වලට සහභාගි වීමේ අවස්ථාවන් විද්‍යාඥයන් හා සෙසු නිලධාරීන් වෙතද ලබාදෙනු ලබයි. පවත්නා කොවිඩ් තත්ත්වය හේතුකොට, 2022 වසර තුළ මෙම මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද වැඩසටහන් මාර්ගගත ක්‍රමවේදය හරහා සිදුකරන ලද අතර මධ්‍යස්ථානයේ එම වැඩසටහන්වලට සහභාගි වීමේ අවස්ථාව පහත සඳහන් ශ්‍රී ලාංකිකයන් වෙත ලැබිණි:

1. **'රටවල අවශ්‍යතාවයනට යෝග්‍ය වනසේ සකසන ලද විශ්ලේෂණ හා මාදිලිකරණ මෙවලම් පරිහරණය' සම්බන්ධ NAM මධ්‍යස්ථානයේ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව, 2022 අප්‍රේල් මස 6-7 (මාර්ගගතව)**

    1. මහාචාර්ය බිලේෂ පෙරේරා, රුහුණු විශ්වවිද්‍යාලයේ ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශයේ මහාචාර්ය.
    2. මොහමඩ් නෆ්රීස් මහතා, පරිගණක තාක්ෂණ උපදේශක, ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය.

2. **'නාගරික තිරසරබව සඳහා ආහාර හරිත නගර සංවර්ධනය' සම්බන්ධ NAM මධ්‍යස්ථානයේ ජාත්‍යන්තර පුහුණු වැඩමුළුව, 2022 අප්‍රේල් මස 26-27 (මාර්ගගතව)**

    1. ආචාර්ය වරුණි ජයසූරිය මහත්මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වනජීවී හා පරිසර විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

3. **'2030 තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමෙහි ලා විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනය යන ක්ෂේත්‍රයන් විසින් ඉටු කරනු ලබන කාර්ය භාරය' සම්බන්ධ NAM මධ්‍යස්ථානයේ ජාත්‍යන්තර මාර්ගගත වැඩමුළුව, 2022 මැයි මස 24-25 (මාර්ගගතව)**

    1. කේ.බී. මධුශානි මහත්මිය, උපාධි අපේක්ෂිකා, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

4. **G77 කණ්ඩායමේ PGTF භාරකාර අරමුදලේ පාර්ශ්වීය සහයෝගයෙන් පැවැත්වෙන 'සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආහාර හා ජලය හරහා සිදුවන ආසනික් නිරාවරණ තත්ත්වයන් අවම කිරීම - අනාගතය සඳහා වූ තාක්ෂණික විසඳුම් උදෙසා සැකසුණු මාර්ග සිතියමක්' සම්බන්ධ ව්‍යාපෘතිය**

    **i) 'සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආහාර හා ජලය හරහා සිදුවන ආසනික් නිරාවරණ තත්ත්වයන් අවම කිරීම - අනාගතය සඳහා වූ තාක්ෂණික විසඳුම් උදෙසා සැකසුණු මාර්ග සිතියමක්' සම්බන්ධ ව්‍යාපෘතියේ මෙරට සම්බන්ධීකාරක**

    මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ රසායනික හා පාරිසරික අංශයේ ආචාර්ය එම්.ජී. පියල් අරවින්න මහතා

    **ii) 2022 ජුනි මස 28-30 දක්වා පැවැත්වූ 'ජල පවිත්‍රකරණ තාක්ෂණයන්, භූගත ජලයෙන් ආසනික් ඉවත් කිරීම හා ඒකාබද්ධ ජල කළමනාකරණය' සම්බන්ධ ජාත්‍යන්තර වැඩමුළුව**

    මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ රසායනික හා පාරිසරික අංශයේ ආචාර්ය එම්.ජී. පියල් අරවින්න මහතා

5. **නොබැඳි ජාතීන්ගේ සාමාජික රටවල විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය - ZMT Bremen (ජර්මනිය) සහයෝගිතා පර්යේෂණ ශිෂ්‍යත්ව වැඩසටහන: "නිවර්තන වෙරළබඩ සාමුද්‍රික පර්යේෂණයන්හි නීල ආර්ථිකය" – 2022 වසර සඳහා අයැදුම්පත් කැඳවීම**

    1. ඌව-වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ ව්‍යවහාරික පාංශු විද්‍යා අධ්‍යයනාංශයේ භූවිද්‍යා මහාචාර්ය / ප්‍රධානී අමිල සඳරුවන් රත්නායක මහතා

6. **නොබැඳි ජාතීන්ගේ සාමාජික රටවල ඒකාබද්ධ විද්‍යා හා තාක්ෂණ මධ්‍යස්ථානය - JSS AHER, මයිසූර්, ඉන්දියා සහයෝගිතා පර්යේෂණ ශිෂ්‍යත්ව වැඩසටහන - 2022-23 සඳහා අයැදුම්පත් කැඳවීම**

    1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඖෂධවේද හා ඖෂධ විද්‍යා අධ්‍යයනාංශයේ දර්ශනසූරි උපාධි අපේක්ෂිකා සිතාරා විනෝදනී මහත්මිය

7. **'යටිතල පහසුකම් සංවර්ධනය සහ තිරසර කාර්මිකකරණය සඳහා නවෝත්පාදනයන් බලගැන්වීම' පිළිබඳ නොබැඳි ජාතීන්ගේ සාමාජික රටවල ජාත්‍යන්තර වැඩමුළුව, 2022 නොවැම්බර් 17-18 (මාර්ගගත)**

   1. හෝමාගම, දියගම මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනයේ (ITUM) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය කේ. එම්. ඩබ්. අබේකෝන් මහතා

## මානව සම්පත් සංවර්ධනය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විද්‍යා හා තාක්ෂණ කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සම්පාදනයේ ප්‍රධාන ආයතනය වශයෙන්ද උපදේශනායතනය වශයෙන්ද පිහිටුවනු ලැබ ඇත.

උක්ත කාර්යය ඉටු කරනු පිණිස, ආයතනික අරමුණු හා අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමෙහි ලා ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරමින් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව රට තුළ විද්‍යාව හා තාක්ෂණය සංවර්ධනය උදෙසා වූ ප්‍රයත්නයක නිරතව සිටී.

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ ආයතනික ව්‍යුහයට අනුව සභාපතිවරයා කොමිෂන් සභාවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරයි. අධ්‍යක්ෂවරයා වනුයේ ප්‍රධාන විධායක නිලධාරියාය. ආයතනික ප්‍රතිපත්ති, උපාය මාර්ගික සැලසුම් හා විද්‍යාව හා තාක්ෂණය ආශ්‍රිත සෙසු ලේඛන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ජ්‍යෙෂ්ඨ විද්‍යාඥයෝ හා විද්‍යාඥයෝ, බාහිර පාර්ශවකරුවන් හා උපදේශක සංසද සමගින් සහාය දක්වමින් එක්ව කටයුතු කරති. නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදල් හා පරිපාලන) ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ මූල්‍ය හා පරිපාලන කළමනාකරණ කටයුතු මෙහෙයවීම සිදුකරයි. සහාය කාර්ය මණ්ඩලය පරිපාලන නිලධාරියෙකුගෙන්, වැඩසටහන් සහායකවරුන් දෙදෙනෙකුගෙන් (එනම්, වැඩසටහන් සහකාර - මුදල් හා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ/ දත්ත ගබඩා සහකාර), කළමනාකරණ සහකාරවරුන් පස් දෙනෙකුගෙන්, කාර්යාල කාර්ය සහායකවරුන් දෙදෙනෙකුගෙන් හා රියැදුරන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව ඉල්ලුම් පදනමින් නිශ්චිත කාර්යයන් හා පැවරුම් සඳහා පර්යේෂණ සහකාරවරුන්ගේ සේවය බාහිරින් ලබාගනු ලබයි.

## කාර්ය මණ්ඩල පුවත්

- කීර්තිමත් සම්මානිත මහාචාර්ය හා රසායන විද්‍යා මහාචාර්ය දර්ශන විශාරද වෙරන්ජ කරුණාරත්න මහතා (FRSC, FNAS) ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබූ අතර ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ කාර්යාලයේදී 2022 ඔක්තෝබර් මස 10 වන දින ඔහුගේ වැඩ භාරගැනීම සිදුවිය.



*රූපය 11 : මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් වැඩ භාරගැනීම.*

- 2022 මාර්තු මස 14වන දින වැඩබලන අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී තනතුරින් නසීමා අහමඩ් මහත්මිය ඉල්ලා අස්වූ අතර, අප ඇයගේ සේවය අගය කරන්නෙමු.

- 2022 මාර්තු මස 15 දින පටන් වැඩබලන අධ්‍යක්‍ෂ/ ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත් වූ ජනක එස්. ගීකියනගේ මහතා කොමිෂන් සභාව විසින් උණුසුම් ලෙස පිළිගනු ලැබිය.

- අතිශයින් තරගකාරී ශිෂ්‍යත්ව ප්‍රදාන යෝජනාක්‍රමයක් හරහා එක්සත් ජාතීන්ගේ විශ්වවිද්‍යාලය (CRIS) විසින් මෙහෙයවනු ලබන නවීන රාජ්‍ය තාන්ත්‍රිකත්ව විෂයය පිළිබඳ ග්‍රීෂ්ම විද්‍යා පීඨයට ඇතුළත් වීම සඳහා ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ සෙයිඩ් ෂාමි මහතා තෝරාගන්නා ලදී.

- 2022 ජුලි මස 03වන දින ඉෂාරා වෙදමුල්ල මිය සිය කළමනාකරණ සහකාර තනතුරින් ඉල්ලා අස් වූ අතර ඇයගේ සේවය අගය කරන්නෙමු.

## සුභසාධන කටයුතු

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් සෑම නිලධාරියෙකු වෙතම අඩු පොළී ණය පහසුකමක් යටතේ රු. 35,000 බැගින් ලබාදෙන ලදී.

## ආයතනික පාලන වාර්තාව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ (NASTEC) බලතල සහ කර්තව්‍ය 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ විධිවිධාන යටතේ අතිගරු ජනාධිපතිතුමන් විසින් පත්කරන ලද, සාමාජිකයන් සත් (07) දෙනෙකුගෙන් සැදුම්ලත් කොමිෂන් සභාව සහ එහි සභාපතිවරයා වෙත පැවරී ඇත.

2021 ජනවාරි සිට 2022 ඔක්තෝබර් දක්වා කොමිෂන් සභාවේ ගණ පූරණය රහිත තත්ත්වයක් පැවති අතර, 2022 සැප්තැම්බර් මාසය දක්වා ආසන්න වශයෙන් වසර දෙකක කාලයක් පුරා කොමිෂන් සභාවේ සභාපතිවරයා පත් නොකරන ලද තත්ත්වයක් පැවතිණි. කොමිෂන් සභාවේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු විධි නියෝගය ප්‍රකාර යම් මූල්‍ය වර්ෂයක් සඳහා ක්‍රියාත්මක කරන අතර ඒවා කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ හා දැඩිසේ අනුගත විය යුතුද වේ. සමාලෝචන කටයුතු සඳහා විද්‍යා හා තාක්ෂණ ආයතන හඳුනා ගැනීම, එම ආයතනයන්හි සමාලෝචන කටයුතු සිදුකරනු පිණිස විශේෂඥ මණ්ඩල කමිටු පත් කිරීම, ප්‍රචාරය කිරීමට පෙර කෙටුම්පත් සමාලෝචන වාර්තා මෙන්ම විද්‍යා හා තාක්ෂණ තත්ත්ව වාර්තාවන් සඳහාද අනුමැතිය ලබාගැනීම, කාලීන හා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපාය හා සැලසුම් සකස් කළයුතුව පවත්නා බැව් රජයට දැනුම් දීම සහ ඉහත කරුණට අදාළ සියලු කටයුතු සාකච්ඡා කරනු පිණිස අදාළ පාර්ශ්වකරුවන් වෙත සාකච්ඡා මණ්ඩපයක් සකස් කරදීමේ අදහසින් ද්විවාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව කැඳවීම යන කටයුතු එවන් වාර්ෂික කටයුතු අතරට ඇතුළත් වේ.

2022 දෙසැම්බර් මස 31වන දිනට කොමිෂන් සභාවේ සංයුතිය පහත පරිදි විය:

| | | |
|---|---|---|
| මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න මහතා | - | සභාපති |
| දීපා ලියනගේ මහත්මිය | - | කොමිෂන් සභා සාමාජික |
| ආචාර්ය ඩී.එම්. සුරතිස්ස දිසානායක මහතා | - | කොමිෂන් සභා සාමාජික |
| මහාචාර්ය ඩී. එස්. ඒ. විජේසුන්දර මහතා | - | කොමිෂන් සභා සාමාජික |
| ආචාර්ය කේ.ජී.අයි. අමරසිංහ මහතා | - | කොමිෂන් සභා සාමාජික |
| ආචාර්ය නිර්මලී ද සිල්වා මහත්මිය | - | කොමිෂන් සභා සාමාජික |
| තුෂාර වජිර පෙරේරා මහතා | - | කොමිෂන් සභා සාමාජික |
| දිලූපා ප්‍රනාන්දු මහත්මිය | - | භාණ්ඩාගාර නියෝජිත |

පත්කිරීම්වලින් අනතුරුව නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී කොමිෂන් සභාව විසින් රැස්වීම් දෙකක් පවත්වන ලදුව පහත සඳහන් ප්‍රතිපත්තිමය තීරණ ගන්නා ලදී,

- "දේශගුණික විපර්යාස හමුවේ තිරසර සංවර්ධනය පිණිස විද්‍යාව, තාක්ෂණය හා නවෝත්පාදනය" යන තේමාව යටතේ 2023 මාර්තු මස 23 සහ 24 දෙදින IX වන ද්වි-වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුව පැවැත්වීම.
- විද්‍යා හා තාක්ෂණ ආයතනික සමාලෝචන උදෙසා ඵලදායි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.

## විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව (AMC) නිසි පරිදි පිහිටුවන ලදුව ආයතනයේ මෙහෙයුම් සහ කාර්ය සාධනය හා සම්බන්ධිත මූල්‍යමය ගැටලු සහ පාලනය අධීක්ෂණය කරනු පිණිස නිතිපතා රැස්වීම් පවත්වනු ලබයි. එම කමිටුව කොමිෂන් සභාවට වගකිව යුතුවේ.

ආයතනයේ අධීක්ෂණ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමෙහි ලා කමිටුව විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ආයතනික පාලනයට අදාළ මාර්ගෝපදේශ සහ රජය සතු ව්‍යාපාර සම්බන්ධ මෙහෙයුම් අත්පොතට අනුව, ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව කොමිෂන් සභා සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර භාණ්ඩාගාර නියෝජිතවරයා විගණන හා කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරයි. විගණන හා කළමනාකරණ කමිටුවේ ගණපූරණය සාමාජිකයන් ගණනින් බහුතරය වේ. ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයෙකු/ බාහිර විගණක සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා නිරීක්ෂකයන් වශයෙන් කටයුතු කරති.

විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක් රැස්වන අතර නිවැරදි කිරීමේ පියවරයන් ගැනීමට අවශ්‍ය පහසුකම් සලසනු පිණිස රැස්වීමේ සාකච්ඡා සටහන්ද සමගින් සිය නිර්දේශ කොමිෂන් සභාව වෙත වාර්තා කරයි.

වසර තුළ කමිටුව විසින් (2022 පෙබරවාරි 22 සහ  නොවැම්බර් 14 ලෙස) රැස්වීම් 02ක් පවත්වන ලද අතර, ජාතික විගණන කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද සියලු වාර්තා සමාලෝචනය කරන ලදී.

## මූල්‍ය ප්‍රකාශන

### ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව
**2022 දෙසැම්බර් මස 31වන දිනට අවසන් වසර සඳහා**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**
(සියලු මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

| **වත්කම්** | සටහන් | **2022** | **2021** |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 1 | 20,572,306 | 1,642,696 |
| ආපසු ලබාදිය හැකි තැන්පතු | 2 | - | 75,500 |
| කාර්ය මණ්ඩල ණය - දිගු කාලීන | 3 | 507,333 | 484,500 |
| | | **21,079,639** | **2,202,696** |
| **ජංගම වත්කම්** | | | |
| කාර්ය මණ්ඩල ණය - කෙටි කාලීන | 4 | 248,000 | 243,833 |
| පෙර ගෙවුම් | 5 | 6,883 | 7,551 |
| භාණ්ඩ ලේඛන/ තොග | 6 | 153,345 | 96,453 |
| මුදල් හා මුදල් සමාන දෑ | 7 | 1,381,089 | 1,023,097 |
| **සමස්ත වත්කම්** | | **1,789,317** | **1,370,934** |
| **බැරකම්** | | **22,868,956** | **3,573,630** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විලම්බිත ආදායම | 8 | 402,890 | 758,012 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 9 | 4,524,786 | 4,244,226 |

| | | | |
|---|---|---|---|
| **ජංගම බැරකම්** | | **4,927,676** | **5,002,238** |
| උපචිත වියදම් | 10 | 1,416,791 | 9,862,883 |
| **සමස්ත බැරකම්** | | **6,344,467** | **14,865,121** |
| **සමස්ත ශුද්ධ වත්කම්** | | **16,524,489** | **(11,291,491)** |
| **ශුද්ධ වත්කම්/ හිමිකම** | | | |
| උපචිත අරමුදල | | 1,907,459 | 1,907,459 |
| ප්‍රති ඇගයුම් අතිරික්තය | | 23,026,677 | 3,741,947 |
| සංචිත | | (8,409,647) | (16,940,897) |
| **සමස්ත ශුද්ධ වත්කම්/ හිමිකම** | | **16,524,489** | **(11,291,491)** |
| | | | |

01 හා 02 පිටුවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හා 07 සිට 11 දක්වා පිටුවල සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ. කොමිෂන් සභා සාමාජිකයන් මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම විෂයයෙහි වගකිව යුතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශන කොමිෂන් සභා සාමාජිකයන් විසින් අනුමත කරන ලදුව ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

(අ/කළේ)
සභාපති

(අ/කළේ)
වැ.බ. අධ්‍යක්ෂ

(අ/කළේ)
නි. අධ්‍යක්ෂ
මුදල් හා පරිපාලන

(අ/කළේ)
කොමිෂන් සභා සාමාජික

*රූපය 12: මූල්‍ය ප්‍රකාශනය - පිටුව 1*

## ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

**2022 දෙසැම්බර් මස 31වන දිනට අවසන් වසර සඳහා**

**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය**

(සියලු මුදල් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

| 1 | සටහන් | 2022 | 2021 |
|---|---|---|---|
| **පුනරාවර්තන ප්‍රදාන** | | 20,179,000 | 19,029,100 |
| ප්‍රාග්ධන ප්‍රදාන - පර්යේෂණ හා සංවර්ධන | | 2,040,000 | 1,619,000 |
| රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය - ක්ෂයවීම් | | 3,587,878 | 551,393 |
| නැවත එකතු කළා - NAM S&T Centre මධ්‍යස්ථානයට ගෙවිය යුතුවන දායක මුදල | 11 | 6,897,700 | - |
| ආදායම | 12 | 37,344 | 30,728 |
| | | **32,741,922** | **21,230,221** |
| **වියදම්** | | | |
| පුද්ගල පඩිනඩි | 13 | 10,389,312 | 10,120,018 |
| ගමන් වියදම් | 14 | 9,280 | 2,734 |
| පරිහරණය කළ සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය | 15 | 225,271 | 297,765 |
| නඩත්තු | 16 | 455,349 | 656,690 |
| කොන්ත්‍රාත් සේවා | 17 | 7,855,381 | 7,412,177 |
| මාරු කිරීම් | 18 | 380,973 | 4,486,086 |
| පර්යේෂණ හා සංවර්ධන | 19 | 961,583 | 1,333,158 |
| රැස්වීම් වියදම් | 20 | 345,649 | 81,360 |

| | | | |
|---|---|---|---|
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය වියදම් | 5 | <u>3,587,878</u> | <u>551,393</u> |
| **සමස්ත වියදම්** | | **<u>24,210,676</u>** | **<u>24,941,381</u>** |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද අතිරික්තය/ (හිඟය)** | | **<u>8,531,246</u>** | **<u>(3,711,160)</u>** |
| **මූල්‍ය පිරිවැය** | | | |
| දේපළ, පිරියත හා උපකරණ අලෙවියෙන් ලද ලාභය | | | |
| **කාල පරිච්ඡේදය සඳහා වූ ශුද්ධ අතිරික්තය/ (හිඟය)** | | **<u>8,531,246</u>** | **<u>(3,711,160)</u>** |

*රූපය 13: මූල්‍ය ප්‍රකාශනය - පිටුව 2*

# විගණකාධිපති වාර්තාව

(16)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/D/NASTEC/1/22/98
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2023 අගෝස්තු 04 දින

සභාපති
ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11ට අනුකූල නොවන පරිදි ආයතනය විසින් රු.3,587,878 ක් වූ වාර්ෂික ක්‍රමක්ෂය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායම ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.3,587,878 කින් වැඩියෙන් දක්වා තිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව / இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. / No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සභාවේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

(15)

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ

ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව විසින් පවත්වාගෙන ගොස් තිබුණි.

පිටුව 4 | 6

(14)

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | | නිරීක්ෂණ |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති 2021/01 අංක සහිත මුදල් අමාත්‍යාංශයේ පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය | (i) | මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව දින 60 ක් ඇතුලත වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් සමඟ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වුවත් ආයතනය විසින් වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. එසේම උක්ත වගන්තිය අනුව මුදල් වර්ෂය ආරම්භ වී මාස 05 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවද 2021 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව මෙතෙක් සභාගත කර නොතිබුණි. |

(ii) මුදල් වර්ෂය අවසන් වීමෙන් පසුව දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ආයතනය විසින් දින 50 ක් ප්‍රමාද වී මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත 2022 මැයි මස 12 දින ඉදිරිපත් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ද) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

## 2.3 වෙනත් කරුණු

2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කර තිබූ ප්‍රධාන ක්‍රියාකාරකම් 05 හි ඇතුළත් අනු ක්‍රියාකාරකම් ගණන 15 ක් වූ අතර ඉන් ක්‍රියාකාරකම් 02 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තු ගත පිරිවැය රු. 100,000 ත් රු. 2,350,000 ත් අතර පරාසයක් ගෙන තිබූ ක්‍රියාකාරකම් 07 ක භෞතික ප්‍රගතිය සියයට 0 ත් සියයට 56 ත් අතර පරාසයක පමණක් වී තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු**

---

I.2 2023 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සංශෝධිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11ට අනුකූලව කටයුතු කරනු ලැබේ .

2.2.2

i. 2021 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව 2023.04.20 වන දින අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ අතර අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුණු පසුව ඉදිරි කටයුතු කරනු ලැබේ.

2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන, 2023 මැයි මස 11 වන දින යොමු කළ අතර මාර්තු මස පැවති IX වැනි ද්වි වාර්ෂික විද්‍යා හා තාක්ෂණ සමුළුවේ (BICOST IX) රාජකාරි කටයුතු සඳහා සම්පූර්ණයෙන්ම කාර්ය මණ්ඩලය නිරතවී සිටි බැවින් සහ කාර්ය මණ්ඩල හිඟතාවය (පුරප්පාඩු 7 ක් පැවතීම) හේතුවෙන් මාස 2ක් වැනි කාලයක් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම ප්‍රමාද වුණි. මූල්‍ය ප්‍රකාශන ඉදිරියේදී නියමිත කාලය තුළ පිළියෙළ කර ඉදිරිපත් කිරීමට නිලධාරීන්ට උපදෙස් දෙන ලදී.

2.3

2022 වර්ෂයට අදාළ සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකළ යුතු වන්නේ වෙනත් ආයතන සමග සහයෝගීත්වයෙන් සහ විවිධ ක්ෂේත්‍රවල විශේෂඥවරුන්ගේ සහභාගිත්වයෙනි. එබැවින් මෙම ක්‍රියාකාරකම් සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය පැවතීම අනිවාර්ය වේ (බොහෝ වාර්තා ජාතික මට්ටමින් ඉදිරිපත් කළ යුතු බැවින්) . නමුත් 2022 වර්ෂයේ ඔක්තෝබර් මස වනතුරු කොමිෂන් සභාවේ ගණපූරණය නොමැතිකම හේතුවෙන් සහ ස්ථිර සභාපතිවරයකු නොසිටීම හේතුවෙන් කොමිෂන් සභාව ක්‍රියාත්මක නොවූ බැවින් අදාළ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය. මේ සම්බන්ධයෙන් 2022 ජුලි 18 දින යවන ලද NASTEC/03/Action plan/2022 දරණ ලිපියෙන් විෂය භාර අමාත්‍යාංශ ලේකම්තුමන් දැනුවත් කිරීමක් සිදු කෙරුනි. එබැවින් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ඇති ප්‍රධාන ක්‍රියාකාරකම්වල බලාපොරොත්තු වූ භෞතික හා මූල්‍ය ප්‍රගතින් පෙන්වීමට නොහැකි විය. 2023 වර්ෂයේ ක්‍රියාකාරකම් කොමිෂන් සභා නිර්දේශ හා අනුමැතීන්ට යටත්ව ක්‍රියාත්මක කරමින් පවතී .

**මහාචාර්ය වෙරන්ජ කරුණාරත්න**


සභාපති

# පසුගිය වසර 10 හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ

| වර්ෂය | මූල්‍ය තොරතුරු (රු. මිලියනයෙන්) | | |
|---|---|---|---|
| | වෙන් කිරීම | ලැබුණු අරමුදල් | වියදම් |
| 2013 | 33.00 | 22.02 | 22.37 |
| 2014 | 37.00 | 27.84 | 27.93 |
| 2015 | 36.60 | 22.52 | 22.20 |
| 2016 | 36.00 | 32.16 | 33.50 |
| 2017 | 43.75 | 30.10 | 34.40 |
| 2018 | 45.00 | 43.20 | 38.96 |
| 2019 | 40.80 | 30.47 | 35.93 |
| 2020 | 35.10 | 26.36 | 28.91 |
| 2021 | 51.00 | 21.15 | 24.89 |
| 2022 | 49.00 | 22.22 | 20.62 |

*වගුව 01. පෙර වසර 10 (2013-2022) හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ*

14 රූපය පසුගිය වසර 10 ක මූල්‍ය තත්ත්වය ප්‍රතිපාදන සහ ලැබුණු අරමුදල් අතර ප්‍රතිශතය සහ ලැබුණු අරමුදල් සහ වියදම් අතර ප්‍රතිශතය ලෙස පෙන්නුම් කරයි.




*රූපය 14: පෙර වසර 10 (2013-2022) හි මූල්‍ය අංශයේ ඇතිකරගත් සුවිශේෂී ජයග්‍රහණ*